<u>සැපයුම්කරුවන්/කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම-2027</u>

හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා භාණ්ඩ(සැපයුම්) වැඩ හා උපදේශන නොවන සේවාවන් ලබා ගැනීම පිණිස 2027 වර්ෂය වෙනුවෙන් ලියාපදිංචි වීමට කැමති පිළිගත් නිෂ්පාදකයින්ගෙන් /දේශීය ඒජන්තවරුන්ගෙන්/ සැපයුම්කරුවන්ගෙන්/ සේවා සැපයුම්කරුවන්ගෙන් සහ කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්පත් බාර ගැනීම **2026.11.02** දින සිට **2026.12.18** දින දක්වා හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගිණුම් අංශයේ දී සිදු කරනු ලැබේ. ඒ සඳහා වන අයදුම්පත , උපදෙස් පත්‍රිකා සහ ලියාපදිංචි කිරීමේ අයිතම ලයිස්තුව හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිල වෙබ් පිටුව වන www.hambantota.dist.gov.lk හි බාගත කිරීම් (download) යටතේ වන සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ විස්තරය (Supply registration Details) වෙත පිවිස බාගත කළ හැකිය.

ඉහත නිල වෙබ් පිටුවට ඇතුළත් කර ඇති අයිතම ලයිස්තුවේ සඳහන් අයිතමයන් වෙනුවෙන් ලියාපදිංචි විය හැකි අතර, එක් අයිතමයක් සඳහා **රු. 750.00** ක ගාස්තුවක් අයකරනු ලැබේ. අයදුම්පත මඟින් ඉල්ලුම් කරනු ලබන අයිතමයන් වෙනුවෙන් සම්පූර්ණ ලියාපදිංචි කිරීමේ ගාස්තුව "**දිස්ත්‍රික් ලේකම්, හම්බන්තොට**" නමින් හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගිණුම් අංශයේ සරප් වෙත හෝ හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් වෙත ගෙවීම් කර ලැබෙන ලදුපත අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය. නැතහොත් අදාළ ලියාපදිංචි ගාස්තුව හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් නමින් මුදල් ඇණවුමක් වශයෙන් හෝ Govpay හරහා ද ගෙවීම් කළ හැකිය.

සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2026.12.18** දිනට පෙර " **දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, හම්බන්තොට**" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් ගිණුම් අංශයේ ප්‍රසම්පාදන ඒකකයට බාර දිය හැක.

සභාපති

දිස්ත්‍රික් ප්‍රසම්පාදන කමිටුව

හම්බන්තොට